**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර 1 විභාගය 2023 අගෝස්තු**

(104) **ව්‍යාපාරික පරිසරය**

(Business Environment)

- අයදුම්කරුවන්ට උපදෙස් (අවධානයෙන් කියවිය යුතුයි)
  (1) *දී ඇති කාලය (පැය 3යි)*
  (2) *සියලු ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතුවේ*
  (3) *උපකල්පන කිසිවක් ඇතොත් ඒවා පැහැදිලිව දක්වන්න*

පිටු ගණන 4
ප්‍රශ්න ගණන 6

**සැකසුම : තරංග ජයනන්ද**

---

## A කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

අංක **1.1** සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න වලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරන්න

**1.1 විධිමත් ව්‍යාපාරයක ලක්ෂණයක් නොවන්නේ**

1. අඛණ්ඩ ක්‍රියාවලියක් වීම
2. තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ වර්ධනය.
3. ලාභයෙන් අභිප්‍රේරණය වීම
4. සමාජයීය කටයුත්තක් වීම

**1.2 හවුල් ව්‍යාපාරයක ලක්‍ෂණ සම්බන්ධයෙන් අදාළ නොවන්නේ කුමක්ද?**

1. ලියාපදිංචිය අනිවාර්ය නැත
2. ස්වේච්ඡාවෙන් හෝ අධිකරණය මගින් ඇවර කෙරේ
3. හවුල් ව්‍යාපාරයේ නමින් බදු ගෙවයි.
4. අයිතිය හවුල්කරුවන් සතුවේ (2-20)

**1.3 පහත සඳහන් ඒවා අතුරින් ව්‍යාපාරයක අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයක් වන්නේ කවුරුන්ද?**

1. සේවකයන්
2. පාරිභෝගිකයන්
3. සැපයුම්කරුවන්
4. තරගකරුවන්

**1.4 පහත් සඳහන් ඒවා අතුරෙන් චෙක් පතක් අගරු වීම සඳහා හේතුවක් වන්නේ කුමක් ද?**

1. ගිණුමේ මුදල් නොමැති වීම
2. ගිණුම වසා තැබීම
3. අණකරු විසින් බැංකු ගිණුමෙන් ගෙවීම් නවතා තිබීම
4. ඉහත සියල්ලම

**1.5 සන්නිවේදනය ක්‍රියාවලියේ මූලිකාංගයක් නොවන්නේ,**

1. සංකේතකරණය
2. මාධ්‍යය
3. ග්‍රාහකයා
4. බලය

**1.6 පහත සඳහන් දෑ අතුරින් රක්ෂණ මූලධර්මයක් නොවන්නේ කුමක්ද?**

1. ආසන්නතම හේතුව
2. උපරිම විශ්වාසය
3. ප්‍රාරක්ෂණය
4. හානිපූරණය

**1.7 පහත සඳහන් ඒවා අතුරින් විදේශ වෙළඳාමේ දී භාවිතා වන මූලික ලියවිල්ලක් නොවන්නේ කුමක්ද?**

1. නෞභාරපත
2. වාණිජ ඉන්වොයිසිය
3. කොටස් සහතිකය
4. ප්‍රභවස්ථාන සහතිකය

**1.8 මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යාපාර ආචාර ධර්මයක් නොවන්නේ මින් කුමක්ද?**

1. බදු වංචා වලින් වැළැක්වීම
2. තොග ප්‍රපාතනයෙන් වැළකීම
3. සාධාරණව හා අවංකව තරඟ කිරීම
4. ගිණුම්කරණ කටයුතුවල විනිවිදභාවය

**1.9 ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට හේතුවක් වන්නේ?**

1. පර්යේෂණ හා සංවර්ධනය
2. ව්‍යවසායකත්ව හුදකලා බව
3. වෙළඳපොළ/ අලෙවි පහසුකම්
4. නවීන සුදුසු තාක්ෂණය හඳුන්වා දීම

**1.10 ව්‍යවසායකත්වයේ නව ප්‍රවණතාවයක් නොවන්නේ මින් කුමක්ද ?**

1. අභ්‍යන්තර ව්‍යවසායකත්වය
2. හරිත ව්‍යවසායකත්වය
3. නවෝත්පාදන ව්‍යවසායකත්වය
4. කාන්තා ව්‍යවසායකත්වය

**අංක 1.11 සිට 1.15 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශ සත්‍ය හෝ අසත්‍ය දැයි දක්වන්න**

1.11 දායකත්වය මූලධර්මය ජීවිත රක්ෂණයට පමණක් අදාළ වේ.

1.12 විවෘත ගිණුම් යනු ජාත්‍යන්තර වෙළඳාමේ භාවිතා වන ගෙවීම් ක්‍රමයකි.

1.13 තැන්පතු ආශ්‍රිත සේවා පවත්වා ගැනීම වාණිජ බැංකුවක මූලික අරමුණකි.

1.14 හවුල් ව්‍යාපාරයට ප්‍රාග්ධනය නොයොදා තම කීර්ති නාමය පමණක් යොදා ලාභ අලාභ භුක්ති විඳින හවුල්කරු ආරූඪ හවුල්කරු ලෙස හඳුන්වයි.

1.15 ද්විපාර්ශවීය එකඟතාවයක් මත සිදුවන ගනුදෙනුවක් සවල ඉල්ලුම ලෙස හඳුන්වයි.

**අංක 1.16 සිට 1.20 දක්වා දී ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.**

1.16 තොග වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාම අතර වෙනස සඳහන් කරන්න.

1.17 විද්‍යුත් මුදල් වර්ග 2ක් සඳහන් කරන්න.

1.18 හානි රක්ෂණ ලිපිය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

1.19 රජය ව්‍යාපාර සඳහා බලපෑම් ඇති කරන ආකාර දෙකක් සඳහන් කරන්න.

1.20 ධාරක චෙක්පතක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

________________A කොටසෙහි අවසානය________________

JMC VLearning "your virtual learning partner"

## B කොටස
## (මුළු ලකුණු (40)

### 02 වන ප්‍රශ්නය

ප්‍රසන්න රසකැවිලි නිෂ්පාදනය කර ඔහුගේම වෙළඳසැලක අලෙවිකරන ව්‍යාපාරිකයෙකි. ඔහුගේ රසකැවිලි වල ඇති ප්‍රණීත බව නිසාම ඔහුගේ වෙළඳාම දිනෙන් දින දියුණුවෙමින් පවතී. ව්‍යාපාරය තනිවම පාලනය කිරීම අපහසු බැවින් ප්‍රසන්න ඔහුගේ මේ මිතුරකු වන සමීර සමග හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. නමුත් සමීර හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරනවාට වඩා සීමාසහිත පෞද්ගලික සමාගමක් ආරම්භ කිරීම සුදුසු යැයි ප්‍රසන්නට යෝජනා කරයි එමෙන්ම ව්‍යාපාරය සඳහා කඩිනමින් රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලෙස සමීර විසින් ප්‍රසන්නට උපදෙස් දී ඇත

**ඔබ විසින් කළ යුතු දෑ**

(a) හවුල් ව්‍යාපාරයකට සාපේක්ෂව පෞද්ගලික සමාගමක ඇති වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ව්‍යාපාරයේ දියුණුවත් සමඟ ප්‍රසන්න විසින් තෝරාගනු ලබන කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න (ලකුණු 04)

(c) රක්ෂණ මූලධර්ම දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04)

### 03 වන ප්‍රශ්නය

ශානිකා කළමනාකරණ උපාධියක් හදාරණ විශ්වවිද්‍යාල ශිෂ්‍යාවකි. ව්‍යාපාර සඳහා අවශ්‍ය වන උපකාරක සේවාවක් ලෙස මුදල් හා බැංකු වල ඇති වැදගත්කම පිළිබඳව ඇයට සිදු කිරීම්ට ඇති පැවරුමක් සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් ගැටළු සම්බන්ධයෙන් ඔබගෙන් පිළිතුරු අපේක්ෂා කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ**

(a) හොඳ මුදලක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

(b) තැන්පතු භාරගැනීම සහ ණය ලබාදීමට අමතරව වාණිජ බැංකුවක් මගින් සපයන අමතර සේවාවන් 4ක් පෙළගස්වන්න (ලකුණු 04)

(c) මුදලේ කාර්යයන් දෙකක් පැහැදිලි කරන්න (ලකුණු 04)

### 04 වන ප්‍රශ්නය

අසංක දේශීය වශයෙන් කුළුබඩු මිලදීගෙන අපනයනය කරන ව්‍යාපාරයක යෙදී සිටී. මේ වන විටත් රටවල් කිහිපයකටම සාර්ථකව කුළුබඩු අපනයනය කරන අසංක මෙම වසරේ හොඳම කුළුබඩු අපනයනකරුවා ලෙස තේරී පත්වී ඇත. විවිධ රටවල් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම සඳහා අසංක විසින් ඒ සඳහා කළමනාකරුවකු බඳවා ගැනීමට අපේක්ෂා කරයි

**ඔබ විසින් කළ යුතු දෑ**

(a) විදේශ වෙළඳාමේ දී භාවිතා වන ගෙවීම් ක්‍රම දෙකක් හඳුනා දක්වන්න (ලකුණු 02)

(b) විදේශ වෙළඳාමේ දී භාවිතා වන ලියවිලි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04)

(c) විද්‍යුත් වෙළෙඳාම ජනප්‍රිය වීමට හේතු හතරක් සඳහන් කරන්න (ලකුණු 04)

### 05 වන ප්‍රශ්නය

තරිඳු දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් විසිතුරු භාණ්ඩ නිර්මාණය කරන ව්‍යවසායකයෙකි. ඔහු තම නිර්මාණ අලෙවි කුටියක් සීගිරිය ආසන්නයේ පවත්වාගෙන යන අතර මෙරටට පැමිණෙන විදේශිකයන්ට ඒවා අලෙවිකිරීමෙන් ඉහළ මාසික අදායමක් උපයාගනී. වසරකට පමණ පෙර පැවති මැතිවරණ සමයේදී දේශීය

JMC vLearning "your virtual learning partner"

කර්මාන්ත නගාසිටුවීම පිළිබඳ දැඩි කතාබහක් පැවතියද, තවමත් තම ව්‍යාපාරය දියුණු කර ගැනීම සඳහා රජයෙන් කිසිදු සහයක් නොලැබුණු බවට තරිඳු මෙන්ම බොහෝ කුඩා පරිමාණ ව්‍යාපරිකයන් මැසිවිලි නගති.

**ඔබ විසින් කළ යුතු දෑ**

(a) ව්‍යවසායකයා යනු කවරෙක් දැයි නිර්වචනය කරන්න (ලකුණු 02)

(b) ව්‍යවසායකයකු සතු විය යුතු කුසලතා 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04)

(c) ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න (ලකුණු 04)

________________B කොටසෙහි අවසානය________________

**06 වන ප්‍රශ්නය**

COCO Trade පියල් මහතාට අයත් අපනයනය පාදක කොටගත් මධ්‍යම ප්‍රමාණයේ කේවල ස්වාමි ව්‍යාපාරයකි. එමඟින් රස කැවිලි සඳහා අවශ්‍ය පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලැබේ. පියල් මහතා මෙම ව්‍යාපාරය මීට වසර 20කට පෙර කේවල ස්වාමි ව්‍යාපාරයක් ලෙස ආරම්භ කරන ලදී, COCO Trade ආයතනය ආරම්භයේදී තම නිශ්පාදිත දේශීය වෙළඳපොළ තුළ පමණක් අලෙවි කළ අතර දැනට එහි නිෂ්පාදිත විදේශ වෙළඳපොළවල් වල ද අලෙවි කරනු ලැබේ. මෑතකදී රජය විසින් මෙම නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීම සඳහා සහන රාශියක් හඳුන්වා දෙන ලදී

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව උපාධියක් හැදෑරීමෙන් පසු ආයතනයට සම්බන්ධ වූ සාමාන්‍යාධිකාරී සෙනුරි නිම්සරා මෙනවිය පියල් මහතාගේ එකම දියණිය වන අතර ඔවුන්ගේ ව්‍යාපාරය සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමෙන් ලැබෙන වාසි පිළිබඳව තම පියාට ඒත්තු ගැන්වීය.

නව කළමනාකාරිත්වය හේතුකොට හේතුකොටගෙන COCO Trade ආයතනයේ කළමනාකරණ හා කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය ව්‍යාපාරය පිළිබඳව ඉතා උනන්දුවකින් කටයුතු කරමින් සිටී. අපනයනය පාදක කොටගත් මධ්‍යම පරිමාණ ව්‍යාපාරයක් ලෙස COCO Trade ආයතනය සැපයුම් දාම කලමනාකරණය, තත්ත්ව සහතික දීම් වැනි බොහෝ සාධක පිළිබඳව සලකා බලනු ලැබේ

පසුගිය කාලයේදී ඇති වූ ආර්ථික අර්බුදයත් සමඟ COCO Trade ආයතනයේ නිශ්පාදිතයන්ට විදේශ රටවලින් ඇති ඉල්ලුම පහත වැටුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ පිරිවැටුම සීඝ්‍ර ලෙස පහත වැටුණි තවද COCO Trade ආයතනය නිෂ්පාදනයට ප්‍රමාණවත් පරිදි අමුද්‍රව්‍ය ලබා ගැනීමේ දුෂ්කරතාවයකට ද මුහුණ දෙමින් සිටී. සෙනුරි නිම්සරා මෙනවිය අනාගතයේ දී ඔවුන්ගේ ව්‍යාපාරය වර්ධනය කර ගැනීම සඳහා මෙම සාධක පිළිබඳව ඇගයීමට ලක් කරමින් සිටී

**ඔබ විසින් කළ යුතු දෑ**

(a) තනි පුද්ගල ව්‍යාපාරයක ඇති අවාසි දෙකක් හඳුනා දක්වන්න (ලකුණු 02)

(b) 2007 අංක 7 දරන සමාගම් පනත අනුව ආයතනය වගකීම සීමිත සමාගමක් ලෙස සංස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කළයුතු ලියවිලි හතරක් සඳහන් කරන්න (ලකුණු 04)

(c) ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නගා සිටුවීම සඳහා පිහිටුවා ඇති ආයතන තුනක් නම් කර එම ආයතන වලින් ඉටුවන සේවාවන් දෙක බැගින් සඳහන් කරන්න (ලකුණු 06)

(d) නව කළමනාකාරිත්වයත් සමග ආයතනයට ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීමේදී සලකා බැලිය යුතු කරුණු හතරක් පෙළගස්වන්න (ලකුණු 04)

(e) පියල් මහතාට සිය ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න (ලකුණු 04)

________________C කොටසෙහි අවසානය________________

JMC VLearning your virtual learning partner